# පාඨමාලා විස්තර සටහන 2027



කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්තනය උදෙසා සහාවට සම්පත්

කවර සංකල්පය ඇබිගේල් වික්‍රමනායක
කවර නිර්මාණය අකිල වීරසිංහ

# කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

*ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්*

# පාඨමාලා විස්තර සටහන
# 2027

## කිතු සමිඳාණන් තුළ සබැඳි ජීවිතය

දේවධර්මීය අධ්‍යාපනය යනු සමූහයක් ලෙස එක්ව දරන ප්‍රයත්නයකි.

අපගේ ස්වාමීන් වහන්සේ උතුම්ම ආඥාව නැවත පැහැදිලි කිරීමේදී, එය දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සහ අසල්වැසියාට ප්‍රේම කිරීම ලෙස ප්‍රකාශ කළ සේක (මතෙව් 22:36-40). අපගේ දේවධර්මය මගින් අප අදහන දේ පමණක් සැකසෙන්නේ නැත: ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස අප එකිනෙකා සමඟ ජීවත් වන ආකාරය ද එයින් හැඩගැසිය යුතුය.

2027 වසර සඳහා වන CTS තේමාව මගින් අපට අභියෝග කරන්නේ අප දෙස පමණක් නොබලා, අන් අය තමන්ට වඩා උතුම් කොට සැලකීමටත්, අන් අයගේ ජීවිත හැඩගස්වන කතන්දර සහ තත්ව පිළිබඳව අවධානය යොමු කිරීමටත් ය.

2027 වසරේදී CTS හි ඉගෙනීමට කැපවන ඔබ දිරිමත් කරන්නේ මෙම ප්‍රශ්න නිරන්තරයෙන් විමසා බලන ලෙසයි: මා ඉගෙන ගන්නා දෙය . . .

- මාගේ අසල්වැසියා සමඟ මා පවත්වන සබඳතා හැඩගස්වන්නේ කෙසේද?
- මාගේ ප්‍රජාව - සභාව, පවුල, මිත්‍රත්වයන්, රැකියා ස්ථානය සහ අනෙකුත් ප්‍රජාවන් තුළ මා සහභාගී වන ආකාරය හැඩගස්වන්නේ කෙසේද?
- දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ජීවිතය පිළිබඳ මාගේ අවබෝධය ගැඹුරු කරන්නේ කෙසේද?

අපගේ දේවධර්මීය ඉගෙනීම මගින්, දෙවියන් වහන්සේගේ සෙනඟ ලෙස එකිනෙකා සමඟ විශ්වාසවන්තව ජීවත් වීමට වැඩි වැඩියෙන් හැකි වන පිරිසක් බවට අප පත් වේවා!

**ආසියාතික දේවධර්ම සංගමයේ තෘතීක අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)**
**ශ්‍රී ලංකා ජාතික ධර්මදූත සන්ධානයේ හා (NCEASL)**
**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)**

# සන්නිවේදන තොරතුරු

| | |
|---|---|
| **ලියාපදිංචි වීම** | registrar@cts.lk |
| **ශාස්ත්‍රීය වැඩසටහන්** | student.services@cts.lk |
| **ශිෂ්‍ය ගිණුම් කටයුතු** | student.accounts@cts.lk |
| **අධ්‍යයන ශිෂ්‍යත්ව** | scholarships@cts.lk |
| **පුස්තකාලය** | library@cts.lk |
| **තොරතුරු තාක්ෂණය** | it@cts.lk |
| **ප්‍රායෝගික සේවා පුහුණුව** | practicums@cts.lk |
| **උපදේශන වැඩසටහන්** | counselling@cts.lk \| mac@cts.lk |
| **ශාස්ත්‍රපති වැඩසටහන්** | ma@cts.lk |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | cm@cts.lk |
| **සහකාර පීඨාධිපති**<br>ජූලියන් දේවදසන් මහතා | julian@cts.lk |
| **පීඨාධිපති**<br>දේවගැනි රවින් කල්දේරා | ravin@cts.lk |

**+94 11 2890809 | www.cts.lk**

# පටුන


| | *පිටු අංකය* |
|---|---|
| **පොදු තොරතුරු** | **4** |
| **1 වාරය: ජනවාරි-අප්‍රේල්** | |
| කාල සටහන | **6** |
| කාල සටහන (උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය) | **7** |
| උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා | **8 – 10** |
| සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා | **10 – 11** |
| උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා | **12** |
| **2 වාරය: අප්‍රේල්-ජූලි** | |
| කාල සටහන | **14** |
| කාල සටහන (උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය) | **15** |
| උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා | **16 – 18** |
| සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා | **18 – 19** |
| උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා | **20** |
| **3 වාරය: සැප්තැම්බර්-දෙසැම්බර්** | |
| කාල සටහන | **22** |
| කාල සටහන (උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය) | **23** |
| උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා | **24 – 26** |
| සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා | **27 – 28** |
| උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා | **28** |
| **කථිකාචාර්යවරුන්ගේ විස්තර** | **29 – 34** |
| **CTS පාඨමාලා විස්තර** | **35** |
| **ළමා සේවා ක්ෂේත්‍රය** | **36** |

# පොදු තොරතුරු

**CTS පාඨමාලා:**

- CTS නියමානුකූල පාඨමාලාවක් සාමාන්‍යයෙන් පවත්වන්නේ සතියකට පන්තියක් බැගින් සති 13ක කාලයක් පුරාය.
- කෙටිකාලීන පාඨමාලා සම්පූර්ණ දින 4ක් පුරා පැවැත්වෙන කඩිනම් අධ්‍යයන පාඨමාලා වේ.
- බොහෝ පාඨමාලාවන්හි පන්තිය තුළ ගත කරන කාලයේ එකතුව පැය 30ක් වුවත් ඇතැම් ඒවායේ පැය 45ක මුළු එකතුවක් තිබිය හැකිය. එසේ නැතහොත් පැය 30ක පන්ති කාමර කාලයක්ද පැය 15ක ප්‍රායෝගික ක්‍රියාකාරකම් කාලයක්ද ඇත.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS කොහුවල පරිශ්‍රයේදී හෝ උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉගැන්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom හරහා ඉගැන්වෙන අතර අදළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.
- **මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය:** පාඨමාලාව පන්ති කාමරය තුළ හා අන්තර්ජාලය හරහා ඉගැන්වේ. ඇතැම් සතිවල ඔබගේ පන්තිය CTS කොහුවල පරිශ්‍රයේදී පැවැත්වෙන අතර අනෙක් සතිවල අන්තර්ජාලය හරහා ඉගැන්වෙනු ඇත. සැලැස්ම පිළිබඳ ඔබගේ කථිකාචාර්යවරයා පාඨමාලාව ආරම්භයේදී ඔබට දැනුම් දෙනු ඇත.

**CTS පාඨමාලා ගාස්තු:**

පාඨමාලාවක් හඳුන්වාදීමේ ගාස්තුව රු. 8,000/- කි.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායී මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ එහි සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලිත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

**පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:**

ලියාපදිංචි වීමේ අයදුම් පත registration.cts.lk සම්පූර්ණ කරන්න. ගෙවීම් අන්තර්ජාලය හරහා https://www.cts.lk/payment/, බැංකු හුවමාරු තුළින්, හෝ ක්‍රෙඩිට් කාඩ් තුළින් කළ හැකිය.

***සැලකිය යුතුයි:*** *පන්තියක ඔබගේ ස්ථානය වෙන්කරනු ලබන්නේ ඔබ පාඨමාලාව සඳහා සම්පූර්ණ ගෙවීම කළ පසුවය.*

**වැදගත්:** පළමු වරට පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන්නන්
ඔබගේ සභාපාලකතුමාගෙන් නිර්දේශ ලිපියක් රැගෙන ආ යුතුය.

**ලියාපදිංචි විය හැකි දින හා වේලාවන්:**

යම් වාරයක පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක්කේ එම වාරය ආරම්භ වන දින දක්වා පමණි.

***පළමු වාරය: 2027 ජනවාරි 6***
***දෙවන වාරය: 2027 අප්‍රේල් 26***
***තෙවන වාරය: 2027 සැප්තැම්බර් 6***

# 1 වාරය
# 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

# කාල සටහන - 1 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ⭘ **ශ්‍රී ලංකා සහ ඉතිහාසය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:45<br>ජී පී වී සෝමරත්න | ⭘ **බයිබලීය අර්ථකථනය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ⭘ **සභාව සහ අවසන් කාලය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>සනත් අතුකෝරාළ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ⭘ **ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>රවින් කල්දේරා<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ⭘ **බහුත්වවාදී සමාජයක ධර්මදූත සේවය**<br>පෙ.ව.9:00-ප.ව.12:00<br>සුරංග අතුකෝරාළ |
| දහවල් | ⭘ **විවාහය කිතුනු දෘෂ්ටිකෝණයකින් දැකීම**<br>ප.ව.3:00-ප.ව.5:45<br>මහින්ද මුණසිංහ | ⭘ **පිබිදීමේ ප්‍රගමනයේ ඉතිහාසය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ඇන්තනි සයිමන් | ⭘ **නායකත්වය**<br>ප.ව.3:00-ප.ව.5:20<br>සරත් ද සිල්වා | ⭘ **පොදු ගැටලූ සඳහා උපදේශනය**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ⭘ **මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය**<br>ප.ව.3:00-ප.ව.6:00<br>බෙනිසි සිල්වා |
| සවස | ✶ **බයිබලීය දේවධර්මය**<br>ප.ව.6:00-ප.ව.8:45<br>සරත් ද සිල්වා | ⭘ **බයිබලීය භාෂා සඳහා ප්‍රවේශය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>රවින් කල්දේරා \| ලසිත් රාජකරුණා | ◘ **දිළිඳු ප්‍රජාවන් පරිවර්තනය කිරීම**<br>ප.ව.6:00-ප.ව.8:20<br>බර්නාඩ් කොස්තා | ⭘ **මතෙව් පොත**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සනත් අතුකෝරාළ | ⭘ **නමස්කාරය පිළිබඳ දේවවේදය**<br>ප.ව.6:00-ප.ව.9:00<br>රවින් කල්දේරා |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# කාල සටහන - 1 වන වාරය - උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | | ● பிலிப்பியர் நிருபத்தை கற்பித்தல் மற்றும் பிரசங்கித்தல்<br>மு.ப.9:00-மு.ப.11:30<br>சர்மிலா சுதாகர் | ● මේය්ප්පත්තුව පරාමරිප්පු<br>மு.ப.9:00-மு.ப.11:30<br>கே. யாபேஸ் | | |
| සවස | | ● Leadership<br>6:00pm–8:30pm<br>*Ivor Poobalan* | ● බයිබලයට අනුකූල යාච්ඤාව ඉගෙනීම<br>ப.ව.5:40-ப.ව.8:00<br>ஞானக ப்ரனான்டு | ● கிறிஸ்தவ கண்ணோட்டத்தில் திருமணம்<br>பி.ப.3:00-பி.ப.5:30<br>வி. கிறிஷாந்தி சந்ரசேகர் | |
| | | ●ஆற்றுப்பணிக்கான அறிமுகம்<br>பி.ப.5:30-பி.ப.8:00<br>கிறிஸ்ரி பாலேந்திரன் | ● ඒසායා<br>பி.ப.5:40-பி.ப.8:00<br>காமினி ஜயந்த | | |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**ශ්‍රී ලංකා සහා ඉතිහාසය** — **අනිවාර්ය**

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි උරුමය හැදෑරීමට අපූරු අවස්ථාවකි. ලංකාව තුළ කිතුනු දහමේ ආරම්භයද, පෘතුගීසින්, ලන්දේසීන්, බ්‍රිතාන්‍යයන් හා ඇමෙරිකානු බලපෑම් තුළින් ක්‍රිස්තියානි සභාව හැඩ ගැසී වත්මන් සභාවේ විවිධත්වය ඇතිවූ ආකාරයද ගවේෂණය කෙරේ.

සති 11
දිනය: සඳුදා
වේලාව: පෙ.ව.9:00-11:45
ආරම්භය: ජනවාරි 11
සම්මාන: 2
කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න**

**විවාහය කිතුනු දෘෂ්ටිකෝණයකින් දැකීම** — **වෛකල්පික**

කිතුනුවකුගේ ජීවිතයේ ඉතාම තීරණාත්මක සිදුවීමක් වන්නේ විවාහයයි. විවාහය පිළිබඳ බයිබලීය දැක්ම තුළින් මතුවන පෙම් ඇසුර, භූමිකාවන් හා වගකීම් සහ විවාහය තුළ ඇති මිත්‍රත්වය වැනි මාතෘකා මෙහිදී සාකච්ඡා කෙරේ. එසේම මුදල් කළමනාකරණය, දරුපල නොමැතිකම, අපයෝජනකාරී සහකරු, ලිංගික ද්‍රෝහිකම සහ දික්කසාදය වැනි අභියෝගයන්ද එහිදී සාකච්ඡා කෙරේ.

සති 11
දිනය: සඳුදා
වේලාව: ප.ව.3:00-5:45
ආරම්භය: ජනවාරි 11
සම්මාන: 2
කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

**බයිබලීය අර්ථකථනය** — **අනිවාර්ය**

බයිබලය සෑම පරම්පරාවක් උදෙසා තිබෙන දෙවියන් වහන්සේගේ නොවෙනස්වන වචනය බව කිතුනුවන්ගේ පිළිගැනීමයි. එහෙත් බයිබලය අර්ථකථනය කර එහි සත්‍යයන් නියමාකාරයෙන් උකහා ගැනීම අපට ඇති අභියෝගයයි. මෙම පාඨමාලාව තුළින් බයිබලයේ ඇති විවිධ සාහිත්‍ය පොත්: උදා. කාව්‍යමය, කථාන්දර, අනාගත වාක්‍ය සහ ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමට ඇවැසි මූලධර්ම සැපයේ.

සති 12
දිනය: අඟහරුවාදා
වේලාව: පෙ.ව.9:00-11:30
ආරම්භය: ජනවාරි 12
සම්මාන: 2
කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

**පිබිදීමේ ප්‍රගමනයේ ඉතිහාසය** — **වෛකල්පික**

කිතුනු පිබිදීම යනු දේශීය හෝ ගෝලීය වශයෙන් ඇතිවන දෙවිඳුන් මූලික අධ්‍යාත්මික උනන්දුව වේ. ඉශ්‍රායෙල් ඉතිහාසයේ පරිහානිය හා ප්‍රතිශ්ඨාපනය පිළිබඳ බයිබලීය වෘත්තාන්තයෙන් කිතුනු පිබිදීම යන සංකල්පය මතු වෙයි. කිතුනු සසුන තුළ ඇති වූ විවිධ පිබිදීම් අධ්‍යයනයෙන් ඔබගේ සේවය තුළ අලුත් වීමක් ලබන්නට පැමිණෙන්න.

සති 12
දිනය: අඟහරුවාදා
වේලාව: ප.ව.3:00-5:30
ආරම්භය: ජනවාරි 12
සම්මාන: 2
කථිකාචාර්ය: **ඇන්තනි සයිමන්**

## 1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**සභාව සහ අවසන් කාලය** — **අනිවාර්ය**

සභාව යනු කුමක්ද? සභාව ලෙස අදහස් කෙරෙනුයේ ගොඩනැගිල්ලක්ද සම්ප්‍රදායක්ද නැතිනම් නමස්කාරයක්ද? අප හඳුනන ලෝකය අවසන් වන්නට යන්නේ කෙසේද? මෙම පාඨමාලාව හැදෑරීමෙන් සභාවේ ක්‍රියාකාරීවීමටත් අවසන් කාලය, ස්වර්ගය හා නිරය පිළිබඳ වැදගත් අවබෝධයක් ලබන්නටත් ඔබට හැකිවනු ඇත.

සති 12
දිනය: බදාදා
වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30
ආරම්භය: ජනවාරි 13
සම්මාන: 2
කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

**නායකත්වය** — **අනිවාර්ය**

*බයිබලයෙන් නායකත්වය ඉගෙනීම*

නායකත්වය පිළිබඳ විවිධ අදහස්වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අපි බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ ඵලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

සති 13
දිනය: බදාදා
වේලාව: ප.ව.3:00-5:20
ආරම්භය: ජනවාරි 6
සම්මාන: 2
කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

**ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය** — **අනිවාර්ය**

පසුගිය සියවස තුළ අන් කවරදටත් වඩා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ කථාබහ සහ සාකච්ඡා පිළිබඳ මහත් උනන්දුවක් ඇතිවී ඇත. ඉතිහාසය පුරා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ දේවවේදය ගොඩනැගුණු ආකාරය ද ශුද්ධ ආත්මයාණන් පිළිබඳව බයිබලය පවසන දේ ද ඉගෙන ගැනීමට අවස්ථාවකි. සභාව තුළත් ඇදහිලිවන්තයන්ගේ ජීවිතය තුළත් ශුද්ධ ආත්මයාණන්ගේ සුවිශේෂී වූත් බලවත් වූත් ක්‍රියා පිළිබඳ දැනගැනීමට මහඟු අවස්ථාවකි.

සති 12
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30
ආරම්භය: ජනවාරි 7
සම්මාන: 2
කථිකාචාර්ය: **රවින් කල්දේරා**

**පොදු ගැටලූ සඳහා උපදේශනය** — **වෛකල්පික**

දුක, ශෝකය, මානසික අසහනය, කාංසාව, හීනමානය, කේන්තිය, ඇබ්බැහිවීම් යනාදී දහසකුත් ප්‍රශ්නවල සමාජය ගිලී ඇත. මෙම ප්‍රශ්න ක්‍රිස්තියානි පවුල්වලට ද බලපායි. මෙවැනි වාතාවරණයක ගිලී සිටින පිරිසට අත්වැලක් වීමට අවශ්‍ය නිපුණතාව මෙහිදී ඔබට ලැබෙනු ඇත.

සති 12
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: ප.ව.3:00-5:30
ආරම්භය: ජනවාරි 7
සම්මාන: 2
කථිකාචාර්ය: **ඊන්ස්ටින් ප්‍රනාන්දු**

## 1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

# උදෑසන, දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

---

**බහුත්වවාදී සමාජයක ධර්මදූත සේවය** — **අනිවාර්ය**

ගැළවීමට එකම මාර්ගය යේසුස් ක්‍රිස්තුස් වහන්සේද? විකල්ප නොසලකා උඩඟු පණිවිඩයක් වෙනත් ආගම්, ලබ්ධීන් හා වෙනත් ජීවන රටා අනුව ජීවත් වන අයට ප්‍රකාශ කළ හැකිද? මෙම පාඨමාලාව ශුභාරංචියේ හදවත වෙතට ඔබ කැඳවාගෙන යන අතර බහුත්වවාදී සමාජයක යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දීම ඵලදායී ලෙස කිරීමට ඔබට මග පෙන්වයි.

සති 10
දිනය: සිකුරාදා
වේලාව: පෙ.ව.9:00-ප.ව.12:00
ආරම්භය: ජනවාරි 8
සම්මාන: 2
කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

---

**මුදල්, වස්තුව සහ දේවරාජ්‍යය** — **වෛකල්පික**

***බයිබලීය භාරකාරත්වය ඉගෙනීම***

මුදල්, ඉතිරිකිරීම්, ආයෝජනය, ණය, දීම, 'සමෘද්ධියේ ශුභාරංචිය', තපස්කම සහ ස්වර්ගීය විපාක යන මාතෘකාවන්ට අදළ දේව වචනයේ පාඨ මෙම පාඨමාලාව තුළින් හදරනු ලැබේ. ඔබගේ ජීවිතයේ සදාතනයටම බලපාන භාරකාරීත්වය පිළිබඳ බයිබලීය දැක්මක් ඇති කරලීම මෙහි අරමුණයි.

සති 10
දිනය: සිකුරාදා
වේලාව: ප.ව.3:00-6:00
ආරම්භය: ජනවාරි 8
සම්මාන: 2
කථිකාචාර්ය: **බෙනිසි සිල්වා**

---

**බයිබලීය භාෂා සඳහා ප්‍රවේශය** — **වෛකල්පික**

කිතුනු ශුද්ධ ලියවිල්ල මුලින් ලියවී ඇත්තේ හෙබ්‍රෙව්, ඇරමෙයික් හා ග්‍රීක් යන භාෂාවන්ගෙනි. එහෙයින් අප කියවන්නේ පරිවර්තනයන් හෝ අනුවාදයන් ය. භාෂාවකට ආවේනික සංස්කෘතිය තුළ අර්ථයන් සන්නිවේදනය වන නිසා කිතුනුවන් බයිබලීය භාෂාවන්ගේ තාක්ෂණය ගැන දැන සිටීම වැදගත් ය. මෙම පාඨමාලාව තුළින් හෙබ්‍රෙව් හා ග්‍රීක් භාෂා පිළිබඳ මූලික ප්‍රවේශයක් ලබා දීමට උත්සාහ දැරේ.

සති 12
දිනය: අඟහරුවාදා
වේලාව: ප.ව.6:00-8:30
ආරම්භය: ජනවාරි 12
සම්මාන: 2
කථිකාචාර්ය: **රවින් කල්දේරා | ලසිත් රාජකරුණා**

---

**මතෙව් පොත** — **අනිවාර්ය**

ග්‍රීක ලේඛන කලාවේ ශුභාරංචි ශෛලිය අද්විතීය වේ. ශුභාරංචි සතරේ සෑම එකකටම ඊට ආවේණික වූ හඬක් ඇත. මෙම පාඨමාලාව තුළ දී මතෙව් ශුභාරංචියේ ප්‍රධාන ලක්ෂණ විමසා බලනු ඇත. ඒවා අතර දේව රාජ්‍යය පිළිබඳ මූලික තේමාව, කන්ද උඩ දේශනාව සහ යේසුස් වහන්සේගේ අනෙකුත් ඉගැන්වීම්, කැපී පෙනෙන උපමා කථා, එහි ව්‍යුහය සහ එහි ධර්මදූත පණිවුඩය වන්නේය.

සති 12
දිනය: බ්‍රහස්පතින්දා
වේලාව: ප.ව.6:00-8:30
ආරම්භය: ජනවාරි 7
සම්මාන: 2
කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

## සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**නමස්කාරය පිළිබඳ දේවවේදය**

වර්තමාන සභාව අන් කිසිදු නොවූ අයුරින් 'නමස්කාරය' කෙරෙහි උනන්දුවක් පෙන්නුම් කරයි. දෙවියන් වහන්සේට ගෞරවය ගෙනෙන්නාවූ නමස්කාරය පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්ද? පරණ ගිවිසුම පුරා ඇති යාග පූජා සහ ඉශ්රායෙලයේ ගීතිකාවන්ගේ සිට නව ගිවිසුමේ සභාවේ නමස්කාරය දක්වා තේමා සොයා, ඇගයීමට ලක්කර, ඒවායේ ප්‍රායෝගික යෙදීම් අවබෝධ කරගැනීම මෙම පාඨමාලාවේදී සිදුවේ.

සති 10 **අනිවාර්ය**

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-9:00

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා**

1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

## සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### මිශ්‍ර ශික්ෂණ මාධ්‍ය

**බයිබලීය දේවධර්මය**

පැරණි ගිවිසුමේ සහ නව ගිවිසුමේ ලියවිලි වට කොට ඇති ප්‍රධාන දේවධර්මය මෙම පාඨමාලාවෙන් හඳුරනු ලැබේ. දෙවියන් වහන්සේ යනු කවුද? මුල් මැවිල්ලේ සිට නව මැවිල්ල දක්වා උන් වහන්සේගේ අද්විතීය සැලැස්ම දිගහැරෙන ආකාරය පිළිබඳ ඔබගේ දැනුම තියුණු කරනු ඇත.

සති 11 **අනිවාර්ය**

දිනය: සඳුදා

වේලාව: ප.ව.6:00-8:45

ආරම්භය: ජනවාරි 11

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

## සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### අන්තර්ජාලය හරහා

**දිළිඳු ප්‍රජාවන් පරිවර්තනය කිරීම**

සෑම දිනකම, දිළිඳුකමින් පෙළෙන ජනතාව අපට මුණගැසේ. සමහරවිට ඔවුන්ගේ අවශ්‍යතාවල විශාලත්වය හමුවේ අප අසරණවන අතර, ඒ නිසා අප ඉවත බලාගනිමු. මෙම පාඨමාලාව මගින් දිළිඳුන් කෙරෙහි දෙවියන් වහන්සේගේ හදවත පිළිබඳ බයිබලීය සහ දේවධර්මීය අවබෝධයක් ලබාදෙන අතර, දිළිඳුකමට විසඳුම් සෙවීම සඳහා තනි පුද්ගලයන් මෙන්ම සභාව ලෙසද උන් වහන්සේ අපට දී ඇති වගකීම පැහැදිලි කරයි.

සති 13 **වෛකල්පික**

දිනය: බදාදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: ජනවාරි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **බර්නාඩ් කොස්තා**

## 1 වන වාරය | 2027 ජනවාරි 6 - අප්‍රේල් 3

# උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### බයිබලයට අනුකූල යාච්ඤාව ඉගෙනීම

**වෛකල්පික**

සෑම බයිබල් වීරයෙකුගේම ජීවනාලිය වී ඇත්තේ යාච්ඤාවයි. යාච්ඤා ජීවිතයට හොඳම උදාහරණය යේසුස් ක්‍රිස්තුන් වහන්සේය. මෙම පාඨමාලාව තුළ උන් වහන්සේගේ යාච්ඤා ජීවිතයද, බයිබලය තුළ වූ ඇදහිලිවන්ත ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ යාච්ඤා ජීවිත ගැනද සොයා බැලේ. මා යාච්ඤා කළ යුත්තේ කෙසේද? යාච්ඤා කළ යුත්තේ කුමකටද, අන් අය යාච්ඤාවට යොමු කරනුයේ කෙසේද යන ප්‍රශ්න ගවේෂණය කරනු ඇත.

සති 13

දිනය: බදාදා

වේලාව: ප.ව.5:40-8:00

ආරම්භය: ජනවාරි 6

සම්මාන: 2

කථිකාචාර්ය: **ශානක ප්‍රනාන්දු**

# 2 වාරය
# 2027 අප්‍රේල් 26 - ජූලි 31

# කාල සටහන - 2 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | ⭘ **එපිසවරුන්ට යැවූ හසුන**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>බෙනිසි සිල්වා | ⭘ **බිඳුණු උද්වේගයට සුවය**<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ⭘ **ළමා උපදේශනය**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>ක්‍රිස්නි එදිරිසිංහ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ⭘ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III**<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>මිශෙල් පීරිස්<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ⭘ **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම**<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>මනෝජ් පීරිස් |
| දහවල් | ⭘ **ප්‍රධාන ආගම්**<br>ප.ව.3:00-ප.ව.5:20<br>ජී පී වී සෝමරත්න | ⭘ **දූතනය පිළිබඳ දේවධර්මය**<br>ප.ව.3:00-ප.ව.5:20<br>සනත් අතුකෝරාළ | ⭘ **කොරින්තියේ සිට කොළඹට**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ෂර්ලි ෆේබර් | ⭘ **උපදේශනයට හැඳින්වීම**<br>ප.ව.3:00-ප.ව.5:30<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ⭘ **ගීතාවලිය ගවේෂණය කිරීම**<br>ප.ව.3:00-ප.ව.5:30<br>විමලසේන ජයලත් |
| සවස | ◘ **ආමොස් පොත**<br>ප.ව.6:00-ප.ව.8:20<br>දිලිප් ගුණවීර | ⭘ **නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා**<br>ප.ව.6:00-ප.ව.8:20<br>ලසිත් රාජකරුණා | ⭘ **පීඩා විඳීම පිළිබඳ දේවවේදය සහ ශ්‍රාවකත්වය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සරත් ද සිල්වා | ⭘ **යෞවන යෞවනියන් සඳහා සේවය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>නාමල් වීරසිංහ | ⭘ **සේවය තුළ මූල්‍යමය කළමනාකරණය**<br>ප.ව.6:00-ප.ව.8:30<br>සුරංග අතුකෝරාළ |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# කාල සටහන - 2 වන වාරය - උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | | ● **கிறிஸ்தவ நியாயவாதம்**<br>மு.ப.9:00-மு.ப.11:20<br>ஜூலியன் தேவதாசன் | ● **கிறிஸ்தவ உக்கிராணத்துவம்**<br>மு.ப.9:00-மு.ப.11:30<br>கிறிஸ்துமணி செல்லையா | | |
| සවස | | ● **The Final Destination: Heaven and Hell in Bible and Theology**<br>6:00pm–8:20pm<br>*Nathanael Somanathan* | ● **නායකත්වයට මඟ: 1 සහ 2 තිමෝති**<br>ප.ව.5:30-ප.ව.8:00<br>ලසිත් රාජකරුණා | ● **கிறிஸ்தவ பிள்ளை வளர்ப்பும் குடும்ப வாழ்வும்**<br>பி.ப.3:00-பி.ப.5:30<br>இரா. ஹரிஹரன் | |
| | | ● **පඤ්චාගමය**<br>பி.ப.5:40-பி.ப.8:00<br>தனராஜ் அஜேந்திரன் | ● **இயேசு கிறிஸ்துவின் வாழ்க்கை**<br>பி.ப.5:30-பி.ப.8:00<br>காமினி ஜயந்த | | |



*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 2 වන වාරය | 2027 අප්‍රේල් 26 - ජූලි 31

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

## එපීසවරුන්ට යැවූ හසුන

**වෙකල්පික**

එපීසවරුන්ට පාවුල් තුමා ලියූ හසුන "පාවුල් තුමාගේ පරමසාරය" ලෙස හඳුන්වනු ලබන්නේ සාරාංශයක් ලෙස ගත්කල එමඟින් ක්‍රිස්තුස් වහන්සේ ඔහුට භාරදුන් ශුභාරංචියේ හරය දැක්වෙන නිසාය. එපීස පොත දෙස කරන්නා වූ මෙම නැවුම් එබී බැලීම තුළ ගැළවීම, සභාව හා කිතුනු ජීවිතය කෙරෙහි වූ ඔබේ දැක්ම පරිනාමනයකට ලක්වනු ඇත.

සති 12

දිනය: සඳුදා

වේලාව: ප.ව.9:00-11:30

ආරම්භය: මැයි 3

සම්මාන: 2

කථිකාචාර්ය: **බෙනිසි සිල්වා**

## ප්‍රධාන ආගම්

**අනිවාර්ය**

***බුද්ධාගම, හින්දු ආගම, ඉස්ලාම් ධර්මය***

බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි යන ලෝකයේ ප්‍රධාන ආගම් සඳහා ශ්‍රී ලංකාව නිවහනක් වී ඇත. තම අසල්වාසීන්ගේ ඇදහිලි හා පුරුදු ගැන අවබෝධයක් කිතුනුවන්ට ලැබෙන පිණිස ඒවායෙහි ප්‍රධාන චර්යාධර්ම පිළිබඳ අවබෝධයක්ද, එම බහු ආගමික සන්දර්භය තුළ සංහිඳියාව හා අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය කරගෙන, එමගින් අපගේ සංස්කෘතියට දී ඇති සුවිශේෂී දායකත්වයන්ද මෙම පාඨමාලාවෙන් හඳුනාගත හැකිය.

සති 13

දිනය: සඳුදා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: අප්‍රේල් 26

සම්මාන: 2

කථිකාචාර්ය: **ජී පී වී සෝමරත්න**

## බිඳුණු උද්වේගයට සුවය

**වෙකල්පික**

මිනිසා උද්වේගයන්ගෙන් පිරි අයෙකි. ඒවා නිවැරදි ලෙස අනාවරණය නොකළහොත් පසු කලෙක දිවියට හානි පමුණුවන රෝගී තත්වයන් බවට පත්වීමට ඉඩ ඇත. එම තත්ව සැඟවුණු බැවින් හඳුනා ගැනීමට ඉතා අපහසුය. මානසික හා ආත්මික වර්ධනයට බාධා පමුණුවයි. එවැනි උද්වේග අවබෝධ කරගෙන කිතුනු දිවිය ගත කිරීමට මෙම පාඨමාලාව මහත් උපකාරයක් වනු නොඅනුමානය.

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව.9:00-11:20

ආරම්භය: අප්‍රේල් 27

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටීන් ප්‍රනාන්දු**

## දූතනය පිළිබඳ දේවධර්මය

**වෙකල්පික**

දූතනය, බයිබලය පුරා පැතිරී ඇති මාතෘකාවකි. ලෝකය පිළිබඳ දෙවියන් වහන්සේගේ කැමැත්ත උත්පත්ති 1 හි එළිදරව් කර ඇති අතර ලොවට ගැළවීම ගෙනෙන පොරොන්දුවක් උත්පත්ති 3 හි සඳහන් වී ඇත. ධර්මදූතනයේ තේමාව සොයා යෑමේදී ආබ්‍රහම්ගේ කැඳවීම, ඉශ්‍රායලයේ කැඳවීම, යේසුස් වහන්සේගේ දූතනය, ක්‍රියා පොත මගින් ගෙනෙන දායකත්වය වැනි මාතෘකා මෙම පාඨමාලාවේදී හදාරනු ලැබේ.

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: අප්‍රේල් 27

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

## 2 වන වාරය | 2027 අප්‍රේල් 26 - ජූලි 31

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

## ළමා උපදේශනය

වර්තමාන සමාජය තුළ වැඩිහිටියන් මෙන්ම දරුදැරියෝ ද බොහෝ ප්‍රශ්නවලට මුහුණ දෙති. ඔවුන් උදෙසා උපකාර කිරීමේ ආශාවක් බොහෝ දෙනෙකුට ඇති නමුත්, නිවැරදිව උපදේශනය කරන්නේ කෙසේදැයි නොදනිති. ළමා උපදේශනය නම් වූ මෙම විෂය මගින් ළමා වර්ධනය, මානසිකත්වය හා පරිසරය ආශ්‍රිත තේමා පිළිවෙළින් හා න්‍යායාත්මකව හැදෑරීමට අවකාශ සැලසේ.

සති 12 | වෙකල්පික

දිනය: බදාදා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30

ආරම්භය: අප්‍රේල් 28

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

## කොරින්තියේ සිට කොළඹට

*කොරින්තිවරුන්ට ලියන ලද පළමු හසුන*

මෙම පාඨමාලාවේ දී, කොරින්ති සභාවේ තිබූ අර්බුදවලට වූ විසඳුම් සමකාලීන නාගරික ක්‍රිස්තියානියට අදාළ කිරීමේ අරමුණ ඇතිව පළමු කොරින්ති හසුන අධ්‍යයනය කෙරේ. සභාව තුළ බෙදීම්, ඇදහිලිවන්තයන් අතරේ නඩුකිම්, සභා විනය, දික්කසාදය, කිතුනු නිදහස සහ ආත්මික දීමනා වැනි මාතෘකා සාකච්ඡා කෙරෙනු ඇත.

සති 12 | වෙකල්පික

දිනය: බදාදා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: අප්‍රේල් 28

සම්මාන: 2

කථිකාචාර්ය: **ෂර්ලි ෆේබර්**

## ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III

*20 වන ශතවර්ෂය*

විසිවන සියවස ක්‍රිස්තියානි ශාසනයට ඉතා වැදගත් ය. පෙන්තකොස්ත ප්‍රගමනය, සාමයික ප්‍රගමනය, ශීතල යුද්ධය අතරම බෙදුණු ලෝකයේ ක්‍රිස්තියානි සභාව හා දෙවන වතිකානු සම්මේලනය වැදගත් ප්‍රවණතා වේ. මෙම ප්‍රවණතා හැදෑරීම තුළින් ඔබට වඩාත් බලපෑමක් ඇති කළ හැකි ගෝලීය කිතුනුවෙකු විය හැකිය.

සති 12 | අනිවාර්ය

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30

ආරම්භය: අප්‍රේල් 29

සම්මාන: 2

කථිකාචාර්ය: **මිශෙල් පීරිස්**

## උපදේශනයට හැඳින්වීම

මානසික සහ චිත්තවේගී සහනය අවශ්‍යව සිටින්නාවූ පුද්ගලයන් අපට දෛනික ජීවිතයේදී මුණ ගැසේ. ඔවුන්ට උපකාර කරන පුද්ගලයෙකු ලෙස කිතුනුවෙකු සවිගත වන්නේ කෙසේද? උපදේශනය පිළිබඳ බයිබලීය ඉගැන්වීම් හැදෑරීම, අන් අයට උපකාර කිරීම සහ ඔවුන් පූර්ණත්වයට පත්කිරීමට අවශ්‍ය මූලික කුසලතා සම්බන්ධයෙන් හැඳින්වීමක් මෙහිදී සිදු කෙරේ.

සති 12 | අනිවාර්ය

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: අප්‍රේල් 29

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටින් ප්‍රනාන්දු**

## 2 වන වාරය | 2027 අප්‍රේල් 26 - ජූලි 31

# උදෑසන, දහවල් සහ සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

## ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

**අනිවාර්ය**

"ලෝක දැක්ම උපැස් යුවලක් වැනි ය. අපට පෙනෙන දෙය නොව, අප කුමක් තුළින් දකින්නේද යන්න විස්තර කෙරේ" (පෝල් හීබර්ට්). මෙම පාඨමාලාව අපගේ සිතුම් සහ ආකල්ප ඇගයීමට ලක් කිරීමේ වැදගත්කම පහදයි. මේ ලෝකයේ ක්‍රමයට අනුරූප නොවී ඔබගේ සිතිවිලි සහ චින්තනය නිදහස්ව තබා ගැනීමට ඉවහල් වන බලපෑමක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබෙනු ඇත.

සති 12

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **මනෝජ් පිරිස්**

## ගීතාවලිය ගවේෂණය කිරීම

**වෛකල්පික**

විලියම් වැන්ගැමරන් මෙසේ පවසයි: "ගීතාවලියේ කතුවරයා ආත්මයට ඔක්සිජන් සපයයි." ගීතාවලියේ වූ විවිධ ගීතිකා අර්ථකථනය කිරීම, වැලපීමෙන් දෙවියන් වහන්සේට කථා කරන ආකාරය, නමස්කාරය මෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳ විස්තරය ආදී දේ ඉශ්‍රායෙල් ගීතිකා පොත ගවේෂණය කිරීමෙන් ඉගෙන ගත හැකිය.

සති 12

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

## නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා

**වෛකල්පික**

පුරාණ ඉශ්‍රායෙලයේ හැඩගැස්ම, දැඩි පරිශ්‍රමය සහ ව්‍යවස්ථාව පිළිබඳ කරුණු ආවරණය වන පංච පුස්තකයේ විශාල කොටසක් අධ්‍යයනය කිරීමට මෙම පාඨමාලාවෙන් ඔබට අවස්ථාව ලබා දෙයි. එක් එක් පොතේ ආකෘතිය, එහි පණිවුඩය, ඉශ්‍රායෙල් සෙනඟට එය අදාළ වූයේ කෙසේද සහ එය අදට අදාළ කරගන්නේ කෙසේද යන්න මෙහි අන්තර්ගත වේ.

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: අප්‍රේල් 27

සම්මාන: 2

කථිකාචාර්ය: **ලසිත් රාජකරුණා**

## පීඩා විඳීම පිළිබඳ දේවවේදය සහ ශ්‍රාවකත්වය

**වෛකල්පික**

කිතුනු ජීවිතයෙහි දුක් පීඩාවන් අමුතුම අත්දැකීමක් නොවේ. කිතුනු ශ්‍රාවකත්වය මගින් දුක් පීඩා හා දුක් ගැහැට සඳහා සාධනීය ලෙස මුහුණ දීමට අවශ්‍ය දේවධාර්මික පදනම සැපයීමක් සලසා දෙයි.

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: අප්‍රේල් 28

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

## 2 වන වාරය | 2027 අප්‍රේල් 26 - ජූලි 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## පන්ති කාමරය තුළ

### යෞවන යෞවනියන් සඳහා සේවය

වෙකල්පික

දෙවිඳුන්ගේ ශ්‍රේෂ්ඨ පැවරුම භූගෝලීයව මෙන්ම පාරම්පරිකවද ව්‍යාප්ත වන්නකි. ගෝලීයකරණය හේතුවෙන් තරුණ හඬ හා ජවය, සමාජයේ ස්වභාවය උඩු-යටිකුරු කිරීමට සමත් වුවද දේව රාජ්‍යයේ වැඩ සඳහා එය සභාව මගින් නොසලකා හැරේ. එහෙයින්ම පාඨමාලාවෙන් යොවුන් ගැටලූ, නව යොවුන් අභියෝග සමඟින් අවුරුදු 14 - 21 පසුවන්නන් ශුභාරංචිකරණයෙන් ශ්‍රාවකත්වයට ගොඩනැගීම පිළිබඳව ගවේෂණය කෙරේ.

සති 12

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: අප්‍රේල් 29

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

### සේවය තුළ මූල්‍යමය කළමනාකරණය

වෙකල්පික

සේවයේ හමුවන ප්‍රධාන අභියෝගයක් වන්නේ මූල්‍ය කළමනාකරණයයි. බොහෝ දේව සේවකයෝ මූල්‍යමය අස්ථාවරත්වයකින් පීඩා විඳිති; දෙවියන් වහන්සේ විසින් ලබා දෙනු ලබන සම්පත් නිර්මාණශීලි ලෙස කළමනාකරණය කිරීම, ආයෝජනය හා අරපිරිමැස්ම මගින් මූල්‍යමය ස්ථාවරත්වයක් සඳහා අඩිතාලමක් දමාගන්නේ කෙසේදැයි මෙම පාඨමාලාවෙන් ගවේෂණය කෙරේ.

සති 12

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

## 2 වන වාරය | 2027 අප්‍රේල් 26 - ජූලි 31
# සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා
## අන්තර්ජාලය හරහා

### ආමොස් පොත

වෙකල්පික

අපගේ සමාජයේ පෙර නොවූ විරූ ලෙස දූෂණය, අසාධාරණය සහ ප්‍රචණ්ඩත්වය දක්නට ලැබේ. දෙවියන් වහන්සේට හිමි ගෞරවය සැලසෙන සමාජ පරිවර්තනයක් සඳහා අපේ ප්‍රතිචාරය කෙබඳු විය යුතුදැයි පෙන්වන ආමොස් පොතෙහි කාලීන වැදගත්කමක් ඇත. මෙය බොහෝ කිතුනුවන්ට ප්‍රයෝජනවත් අධ්‍යයනයකි.

සති 13

දිනය: සඳුදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: අප්‍රේල් 26

සම්මාන: 2

කථිකාචාර්ය: **දිලිප් ගුණවීර**

## 2 වන වාරය | 2027 අප්‍රේල් 26 - ජූලි 31

# උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**නායකත්වයට මඟ**

**1 සහ 2 තිමෝති**

තිමෝතිගේ භූමිකාව දැරිය හැකි තරුණ නායකයන් සහ වගකීමක් ඇති විශ්වාසනීය තරුණයකුගේ අවශ්‍යතාව දුටු පාවුල් අපොස්තුළුතුමා වැනි උපදේශකයන් වත්මන් සභාව තුළ සිටීම අවශ්‍ය වේ. 1 සහ 2 තිමෝති පොත ගැඹුරින් අධ්‍යයනය කිරීම, නායකත්වයේ ඉහළ තැන් ගැනීමටත් පරිණත කිතුනුවන් හා තරුණ නායකයින්ට උපදෙස් දීමටත් අභියෝග කිරීමකි.

**වෙකල්පික**

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.5:30-8:00

ආරම්භය: අප්‍රේල් 28

සම්මාන: 2

කථිකාචාර්ය: **ලසිත් රාජකරුණා**

# 3 වාරය

# 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

# කාල සටහන - 3 වන වාරය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | □ නෙහෙමියා පොත<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>මහින්ද මුණසිංහ | ○ රෝම පොත<br>පෙ.ව.9:00-පෙ.ව.11:20<br>රවින් කල්දේරා \| ලසිත් රාජකරුණා | ○ පරණ ගිවිසුම ගවේෂණය<br>පෙ.ව.9:00-ප.ව.12:30<br>චමිලා සුභාෂ් රණසිංහ<br>සහභාගිකමේ කාලය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය<br>පෙ.ව.9:00-ප.ව.12:20<br>සනත් අතුකෝරාළ<br>දේව මෙහෙය<br>පෙ.ව.10:30-පෙ.ව.11:30 | ○ සාකල්‍ය ළමා සංවර්ධනය<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>චමිලා සුභාෂ් රණසිංහ<br>○ මවකගේ අභිප්‍රාය<br>පෙ.ව.9:00-පෙ.ව.11:30<br>ක්‍රිස්නි එදිරිසිංහ |
| දහවල් | ○ ජාකොබ් පොතට අනුකූල කිතුනු ජීවිතය<br>ප.ව.3:00-ප.ව.5:20<br>විමලසේන ජයලත් | ○ සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම<br>ප.ව.3:00-ප.ව.5:20<br>සනත් අතුකෝරාළ | ○ සංස්කෘතිය පිළිබඳ කිතුනු දෘෂ්ටියක්<br>ප.ව.3:00-ප.ව.5:30<br>රවින් කල්දේරා \| ශානක ප්‍රනාන්දු | ○ බයිබලීය සාමසාධනය<br>ප.ව.3:00-ප.ව.5:20<br>ඊන්ස්ටීන් ප්‍රනාන්දු | ○ කිතුනු දෙමාපියභාවය<br>ප.ව.3:00-ප.ව.5:30<br>නාමල් වීරසිංහ |
| සවස | □ අර්ථකථනවේදය<br>ප.ව.6:00-ප.ව.8:20<br>දිලිප් ගුණවීර | ○ දේවධර්මයට හැඳින්වීම<br>ප.ව.6:00-ප.ව.8:20<br>ෂර්ලි ෆේබර් | ○ ඉගෙනීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම<br>ප.ව.6:00-ප.ව.8:30<br>සරත් ද සිල්වා | □ බලපෑමක් ඇති කළ දූතනගාමියෝ<br>ප.ව.6:00-ප.ව.8:20<br>සනත් අතුකෝරාළ | □ සභා පරිපාලනය<br>ප.ව.6:00-ප.ව.8:45<br>සුරංග අතුකෝරාළ |

*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

# කාල සටහන - 3 වන වාරය - උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය

| වේලාව | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| උදෑසන | | **යාක්කෝපු නිරූපම**<br>மு.ப.9:00-மு.ப.11:20<br>சர்மிலா சுதாகர் | **මේය්ප්පත්තුව නිරූපන්ගල්**<br>மு.ப.9:00-மு.ப.11:30<br>கிறிஸ்துமணி செல்லையா | | |
| සවස | | **Mission in the Book of Acts**<br>6:00pm–8:20pm<br>*Mitchelle Peiris* | **ජොහන් ශුභාරංචිය**<br>ப.ව.5:30-ப.ව.8:00<br>අයිවෝ පූබාලන් | **රූත්**<br>பி.ப.3:00-பி.ப.5:20<br>வி. கிறிஷாந்தி சந்ரசேகர் | |
| | | **කලාසාරත්තෙ කුරිත්ත කිරිස්තව කණ්ණෝට්ටම්**<br>பி.ப.5:40-பி.ப.8:00<br>ஜூலியன் தேவதாசன் | **කිරිස්තව පණියාළරින් වාழ්වුම් පණියුම්**<br>பி.ப.5:30-பி.ப.8:00<br>காமினி ஜயந்த | | |



*නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.*

## 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**ජාකොබ් පොතට අනුකූල කිතුනු ජීවිතය**

යේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සහෝදරයාවූ ජාකොබ් තුමා විසින් ලියන ලද එකම හසුන්පත ක්‍රිස්තියානි ජීවිතයට අත් පොතකි. දුප්පතුන්ට සැලකිය යුත්තේ කෙසේද? සභාව තුළ සාමය ඇති කරලීමට කුමක් කළ යුතුද? අපගේ වචන ගැන සැලකිලිමත් විය යුත්තේ ඇයි? ජාකොබ් පොත අධ්‍යයනයෙන් යහපත් අභිප්‍රායන්ගේ සිට පෞද්ගලික අදහස් කිරීම් දක්වා කිතුනු ජීවිතය යොමු කරවයි.

වෛකල්පික

සති 13

දිනය: සඳුදා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: සැප්තැම්බර් 6

සම්මාන: 2

කථිකාචාර්ය: **විමලසේන ජයලත්**

**රෝම පොත**

අගෝස්තින්, මාටින් ලූතර්, ජෝන් වෙස්ලි සහ කාල් බාත් යන අයගේ ජීවිත වල ගැඹුරු පරිවර්තනයකට මුල පිරූ පොතකි. පාවුල් තුමා ඉශ්‍රායෙල් ජාතියට හා සමස්ත මැවිල්ලට දෙවිඳුන්ගේ මිදීමේ සැලැස්ම දක්වමින්, කුරුසිය තුළින් ප්‍රේමය හා සාධාරණත්වය පරිපූර්ණ වීම ඉස්මතු කරයි. මෙම පොත අධ්‍යයනය කිරීම තුළින් ඔබේ ජීවිතය ද පරිවර්තනය වනු නොඅනුමානය.

අනිවාර්ය

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: පෙ.ව.9:00-11:20

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා | ලසිත් රාජකරුණා**

**සභාව තුළ අධ්‍යාපන සේවයක් ඇති කිරීම**

ඔබ ඉරුදින පාසලේ, තරුණ කණ්ඩායම්, බයිබල් අධ්‍යයන කණ්ඩායම් ආදියෙහි ඉගැන්වීමේ නිරතව සිටියි නම් ඔබ කිතුනු අධ්‍යාපනයේ කොටස්කරුවෙකි. ඉගැන්වීම පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්දැයි මෙම පාඨමාලාවෙන් දැනගෙන ජීවිත වෙනස් කරන අපේක්ෂාවෙන් අදහස් කණ්ඩායමට පලදයි ලෙස ඉගැන්වීමට ගැළපෙන පුහුණුවක් සකස්කර ගැනීමට මෙහිදී ඔබ පොළඹවනු ලැබේ.

වෛකල්පික

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

**පරණ ගිවිසුම ගවේෂණය**

දෙවියන් වහන්සේගේ ගැළවීමේ අරමුණු තේරුම් ගැනීමට මෙන්ම අලුත් ගිවිසුම සඳහා අවශ්‍ය ඓතිහාසික, සාහිත්‍යමය සහ දේවධර්මීය පසුබිම පරණ ගිවිසුම මගින් ලබා දෙයි. මෙම පාඨමාලාව, පරණ ගිවිසුමේ පොත්වල ඓතිහාසික පසුබිම, සාහිත්‍යමය ලක්ෂණ සහ ප්‍රධාන දේවධර්මීය තේමා පිළිබඳ හැඳින්වීමක්ද එය විශ්වාසවන්ත ලෙස අර්ථකථනය කිරීමටත්, එහි පණිවිඩය කිතුනු ජීවිතයට හා සේවයට ප්‍රායෝගිකව අදහස් කරගැනීමටත් අවශ්‍ය තොරතුරු සහ මූලික කුසලතාවලින් ද සිසුන් සන්නද්ධ කරවයි.

අනිවාර්ය

සති 12

දිනය: බදාදා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:30

ආරම්භය: සැප්තැම්බර් 8

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

**3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4**

# උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

## පන්ති කාමරය තුළ

### සංස්කෘතිය පිළිබඳ කිතුනු දෘෂ්ටියක්

"සැබෑ ශ්‍රී ලාංකිකයකු වීම" සහ "සැබෑ කිතුනුවෙකු වීම" යනු කුමක්ද? සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සංස්කෘතිය ලබ්ධියකට හෝ සාතන්ට අයත් දෙයක්ද? කිතුනු නොවන පොත්පත්, චිත්‍රපට සහ සංගීතය රසවිඳීමට කිතුනුවන්ට සුදුසුද? ලෞකික බලපෑම්වලට විවෘත වීම අප ආත්මවලට හානිකරද? අපට සංස්කෘතියක් අවශ්‍ය ඇයි? මෙම පාඨමාලාවෙන් මෙවැනි කරුණු සාකච්ඡා කෙරෙනු ඇත.

**අනිවාර්ය**

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: සැප්තැම්බර් 8

සම්මාන: 2

කථිකාචාර්ය: **රවින් කල්දේරා | ශානක ප්‍රනාන්දු**

### කිතුනු සේවකයෙකුගේ ජීවිතය සහ කාර්යය

කිතුනු සේවකයෙකු වීමේ අද්විතීය කැඳවීම තේරුම් ගැනීමට උපකාරී වන විෂයකි. ප්‍රාදේශීය සභාවේ ද සමාජයේ ද උද්‌යෝගීමත්, බලවත් සේවකයෙකු විය හැකි අන්දමත්, නායකයෙකු ලෙස වර්ධනය වන අතරම, ආත්මික ජීවිතය ද ශක්තිමත් පවුල් සබඳතාවයක් ද තබා ගන්නා ආකාරයත් ඉගෙනීමට මෙහිදී අවස්ථාව ලැබේ.

**වෛකල්පික**

සති 13

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:20

ආරම්භය: සැප්තැම්බර් 9

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

### බයිබලීය සාමසාධනය

පුද්ගලයින් අතර ගැටුම දෛනික සිද්ධියකි. එලෙසම ජාතික සහ අන්තර්ජාතික ගැටුම් කිතුනුවන්ගේ අවධානය ගනී. මේ සන්දර්භය ඇතුළත යේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට සාමය සඳහා මැදිහත් වන ලෙස පවසන සේක. බයිබලීය සාමසාධනය ගැටුමේ මූලාශ්‍ර සොයා යෑම, ගැටුම තේරුම් ගැනීම, විසඳීමට සුදුසු ප්‍රතිචාර දැක්වීම සහ සමාව දීම යන පිළිවෙලින් සිදුකෙරේ.

**අනිවාර්ය**

සති 13

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.3:00-5:20

ආරම්භය: සැප්තැම්බර් 9

සම්මාන: 2

කථිකාචාර්ය: **ඊන්ස්ටින් ප්‍රනාන්දු**

### සාකල්‍ය ළමා සංවර්ධනය

දේශයක මෙන්ම සභාවේ ද අනාගත බලාපොරොත්තුව ළමයින් ය. මෑත යුගයේ සාකල්‍ය ළමා සංවර්ධනයට පදනම වී ඇත්තේ බයිබලීය මූලධර්මයන් ය. ළමුන්ගේ වර්ධනීය මූලධර්මයන් වන ශාරීරික, මානසික, චිත්තාවේගීය, සමාජීය සහ අධ්‍යාත්මික යන අංශ පහ ඔස්සේ අධ්‍යයනයේ යෙදේ. කිතුනු කැඳවීම තුළ ළමුන් හැඩගස්වා වර්ධනය කරන්නේ කෙසේදැයි ඉගෙනීමට මං පාදයි.

**වෛකල්පික**

සති 12

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 10

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

### 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

## උදෑසන සහ දහවල් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**මවකගේ අභිප්‍රාය**

දේව සේවයේ යෙදෙන්නන් මෙන්ම පරිණත ඇදහිලිවතුන් සභාවෙහි හෝ සමාජයෙහි කටයුතු කිරීමේදී මවක හා පියෙකු සේ කටයුතු කළ යුතු ය. දෙවිඳුන් විසින් සෑම කිතුනුවෙකු ම කැඳවන භූමිකාවන්හි ජීවත් වීමෙන් ලෝකය ශ්‍රාවකත්වයට ගෙනෙන අන්දම මෙහිදී සාකච්ඡාවට බඳුන් කෙරේ. දේව අභිප්‍රාය අවබෝධ කරගෙන ජීවත් වීමට "Mother Design" නම් ලෝ ප්‍රචලිත ප්‍රායෝගික ඉගැන්වීම් මාලාව අධ්‍යයනයට මෙම පාඨමාලාවෙන් අවස්ථාව ලැබේ.

වෙකල්පික

සති 12

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 10

සම්මාන: 2

කථිකාචාර්ය: **ක්‍රිස්නි එදිරිසිංහ**

**කිතුනු දෙමාපියභාවය**

බයිබලය තුළින් දෙමව්පියෙකු ලෙස දෙවියන් වහන්සේ දක්වන ආකාරයද ඇතිදැඩි කිරීම සම්බන්ධව එහි ඉගැන්වීම් ද මෙම පාඨමාලාවේදී සොයා බලනු ලැබේ. පෝෂණය, ආරක්ෂාව, විනය, උපදෙස් යනාදිය දරුවෙකුගේ වර්ධනයේ සෑම අවධියකදීම දෙමාපිය ආදරය තුළ තිබිය යුතුය. වඩා හොඳ දෙමාපියන් වීමටත්, අන්‍යයන්ට මග පෙන්වීමටත් මේ පාඨමාලාව හැදෑරීම තුළින් හැකියාව ලැබේ.

වෙකල්පික

සති 12

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.3:00-5:30

ආරම්භය: සැප්තැම්බර් 10

සම්මාන: 2

කථිකාචාර්ය: **නාමල් වීරසිංහ**

### 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

## උදෑසන කාලයේ පැවැත්වෙන පාඨමාලා

### අන්තර්ජාලය හරහා

**නෙහෙමියා පොත**

අද්විතීය නායකයෙකු පිළිබඳ සංක්ෂිප්ත, පුළුල් චරිත කථාවක් පරණ ගිවිසුමේ වෙන කිසිම පොතක දක්නට නැත. අතිශයින් මන බඳනා මෙම ලියවිල්ල බයිබලීය නියමයන් පිළිබඳ වටිනා දැනුමක් තුළින් දර්ශනයක් ගොඩනැංවීම, අන් අය සංවිධානය කිරීම, ප්‍රශ්න හමුවේ නොසැලී සිටීම සහ අරමුණු ඉටු කරගැනීමට ඔබට මග පාදා දෙයි.

වෙකල්පික

සති 12

දිනය: සඳුදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 13

සම්මාන: 2

කථිකාචාර්ය: **මහින්ද මුණසිංහ**

### 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

## සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**අනිවාර්ය**

### දේවධර්මයට හැඳින්වීම

අප අදහන දෙය ගැන පැහැදිලි දැනුමක් අපට තිබේද? අපගේ ඇදහිල්ල වෙනත් අයකුට පහදා දීමට ගොස් පැටලී නිරුත්තර වී තිබේද? දේවධර්මයට හැඳින්වීම විෂය ඉගෙනීමෙන් ඔබේ ඇදහිල්ල ඔබටම වඩාත් පැහැදිලිවන අතර අන් අයටත් ආත්ම විශ්වාසයෙන් යුක්තව පහදා දීමට හැකි මඟ පැදීමක් කෙරේ.

සති 13

දිනය: අඟහරුවාදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: සැප්තැම්බර් 7

සම්මාන: 2

කථිකාචාර්ය: **ෂර්ලි ෆේබර්**

**වෛකල්පික**

### ඉගෙනීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම

ඉරුදින පාසැලේ, කුඩා කණ්ඩායමේ හා පංති කාමරයේ කිතුනු ගුරුවරයාගේ අපේක්ෂාව වන්නේ ශිෂ්‍යයන්ගේ ජීවිතවල පැහැදිලි වෙනසක් ඇති කිරීමය. ඔබගේ ඉගැන්වීමේ සේවය වඩා සාර්ථක කරගැනීමට අත්‍යවශ්‍ය ශිෂ්‍ය-කේන්ද්‍රීය විධික්‍රම රාශියක් මෙම පාඨමාලාවෙන් ලබාගත හැකිවේ. විවිධ ඉගෙනීමේ රටා තේරුම් ගැනීම, ඉගෙනීමේ ප්‍රගතිය නිර්මාණය කිරීමේ මානයන්, පාඩම් සැලසුම් කිරීමේ ක්‍රමෝපායන් මේ පාඨමාලාවේදී සාකච්ඡා කෙරේ.

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.6:00-8:30

ආරම්භය: අගෝස්තු 8

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

### 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

## සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### අන්තර්ජාලය හරහා

**අනිවාර්ය**

### අර්ථකථනවේදය

*අර්ථකථනය කිරීමේ ශිල්පය සහ එහි ඉතිහාසය*

අර්ථකථනවේදයේදී දේවධර්මයේ වර්ධනය උදෙසා බයිබලය අර්ථකථනය කර ඇත්තේ කෙසේදැයි යන්න විමසා බැලේ. බයිබලය අර්ථකථනය කිරීමේදී යොදාගන්නා විවිධ මාර්ගයන් මෙහිදී ඔබට හඳුන්වා දෙනු ඇත. ඔබ මෙතෙක් උපකල්පනය කළ දේ ගැන විමසා බැලීමටත් ශුද්ධ ලියවිලි කියවීමේදී හා අර්ථකථනය කිරීමේදී වඩා හොඳ ක්‍රමවේද භාවිත කිරීමටත් ඔබට හැකිවනු ඇත.

සති 13

දිනය: සඳුදා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: සැප්තැම්බර් 6

සම්මාන: 2

කථිකාචාර්ය: **දිලිප් ගුණවීර**

### 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

## සවස් කාලයේ පැවැත්වෙන පාඨමාලා

### අන්තර්ජාලය හරහා

**බලපෑමක් ඇති කළ දූතනගාමියෝ**

දෙවියන් වහන්සේගෙන් මහත් දේ බලාපොරොත්තු වූ හා උන් වහන්සේ වෙනුවෙන් මහත් දේ සඳහා වෙහෙස වූ මිනිසුන්ගේ ජීවිත හා මෙහෙය දෙස බැලීමක් මෙයින් සිදුවේ. දෙවියන් වහන්සේ මේ විශ්වාසවන්ත සේවකයන් තුළින් ඔබ ප්‍රබෝධවත් කර නිර්භීතව හා විශ්වාසවන්තව ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීමට උගන්වන සේක්වා.

වෛකල්පික

සති 13

දිනය: බ්‍රහස්පතින්දා

වේලාව: ප.ව.6:00-8:20

ආරම්භය: සැප්තැම්බර් 9

සම්මාන: 2

කථිකාචාර්ය: **සනත් අතුකෝරාළ**

**සභා පරිපාලනය**

මූල්‍යමය හා පරිපාලනමය වගකීම් සමර්ථ ලෙස කිරීමට සෑම සභාවකම යම් යම් පුද්ගලයන්ගෙන් බලාපොරොත්තු වේ. මෙම වගකීම් නොසලකා හැරීම හෝ අනිසි ලෙස සිදුකිරීම හේතුවෙන් බොහෝ සභා අර්බුදයන්ට පත්වේ. මූල්‍යමය වගවීම හා අයවැය සැලසුම, සංවිධානයේ ක්‍රියාවලියන් සුමටව සිදුකිරීමට අවශ්‍ය ව්‍යුහයන් හා ක්‍රියාමාර්ග සැකසීම වැනි ප්‍රායෝගික හැකියා මෙම පාඨමාලාවෙන් හඳුන්වා දෙනු ලැබේ.

වෛකල්පික

සති 11

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-8:45

ආරම්භය: සැප්තැම්බර් 10

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාළ**

### 3 වන වාරය | 2027 සැප්තැම්බර් 6 - දෙසැම්බර් 4

## උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලා

### පන්ති කාමරය තුළ

**ජොහන් ශුභාරංචිය**

ලියොන් මොරිස් මෙසේ පවසයි: "ජොහන් ශුභාරංචිය යනු කුඩා ළමයකුට දිය මත ඇවිදිය හැකි වූත් හස්තියකුට දිය නෑ හැකිවූත් තටාකයකි." මෙම මාහැඟි ශුභාරංචි පොත තුළ ජොහන් තුමා යේසුස් වහන්සේගේ ඓතිහාසිකත්වය ද උන් වහන්සේගේ පුළුල් ඉගැන්වීම ද ගෙන හැර දක්වයි. ඉතා වැදගත් ක්‍රිස්තියානි ධර්මනියාම ගවේෂණය කරමින් ශ්‍රාවකත්වය සඳහා විප්ලවීය කැඳවීමක් ජොහන් තුමා ඉදිරිපත් කරයි.

වෛකල්පික

සති 12

දිනය: බදාදා

වේලාව: ප.ව.5:30-8:00

ආරම්භය: සැප්තැම්බර් 8

සම්මාන: 2

කථිකාචාර්ය: **අසිවෝ පූබාලන්**

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ජී පී වී සෝමරත්න,** BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්මාන මහාචාර්යතුමාය.*** විපුල ඵලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ටෑමන් ආයතනයේ ද, ලී විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවධර්ම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලය විශ්වකෝෂයේ කර්තෘවරයාය.



**මහින්ද මුණසිංහ,** BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෲසේඩ් ෆෝර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පුර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටී.



**ඊන්ස්ටින් ප්‍රනාන්දු,** HND (Counselling), BTh, PgDip (BAPC)
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සහකාර සම්බන්ධීකාරක: ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. කිතු සෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් සහ උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවලට සම්බන්ධ වී ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබා ගත් අතර පසුව නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ බෞද්ධ ආයුර්වේද මනෝචිකිත්සාව සහ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගත්තේය.



**ඇන්තනි සයිමන්,** BTh
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. වසර 23 ක කාලයක සිට ප්‍රසංසා යාච්ඤා ලංකා සභාවේ පුරෝගාමී සේවයේ යෙදී සිටින්නේය. වසර 28ක පූර්ණකාලීන සේවය තුළ ලාංකීය සභාවේ විවිධ සේවාවන්වලට නායකත්වය ලබා දී ඇත.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**සනත් අතුකෝරාළ,** BSc, BTh, MA (Hons), PhD

***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශිෂ්‍ය කටයුතු සම්බන්ධීකාරකවරයාය.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධරයෙකු වන මෙතුමා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ උපාධියද, දකුණු කොරියාවේ ටෝච් ට්‍රිනිටි දේවධර්ම උපාධි පාසලෙන් ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. යෞවන කිතුමග සඳහා යෞවන දේවගැතිවරයෙකු සහ සේවකයෙකු ලෙස දේවසේවය ආරම්භ කළ ඔහු, කිතු සෙවණ සේවයේ ගෝලත්ව පුහුණු මධ්‍යස්ථානයේ විදුහල්පති ලෙස සේවය කළේය. වර්තමානයේ, ඔහු ශ්‍රී ලංකාවේ සියලු ජාතීන්ගේ සභාවේ දේවගැතිවරයෙකු ලෙස සහ ශ්‍රී ලංකාවේ යෞවන කිතුමග පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරයි.



**සරත් ද සිල්වා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදි උපාධියද, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL–Philippines) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමී සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.



**රවින් කල්දේරා,** DipAgri, BTh, BA, MA

***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පීඨාධිපතිය.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි. ඩලස් දේවධර්ම ශාස්ත්‍රාලයෙන් (ඇමරිකා එක්සත් ජනපදය) බයිබල් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති හෙතෙම අවුරුදු ගණනාවක පුරෝගාමී සභාරෝපණ සේවයේ ඇත්දැකීම් ඇත්තෙකි. පුරාතන මැදපෙරදිග හා බයිබලයේ භූගෝලය පිළිබඳ අවබෝධය නිසා ඔහු ශ්‍රී ලංකා ප්‍රකාශනවල බයිබල් ලෝකය පිළිබඳ සිතියම් නිර්මාණය සඳහා ප්‍රධාන සම්පත්දායකයෙකු ලෙස කටයුතු කොට ඇත. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර




**සුරංග අතුකෝරාළ,** ADCN, DIM, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේව සභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ පරිපාලන කමිටුවේ සභාපති ධුරයද දරයි. එලෙසම දේව සභා සංගමයේ (එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්) අක්තපත්‍රධාරියෙක් වන හෙතෙම වර්තමානයේ සිම්පල් මියුසික් හි සාමාන්‍ය අධිකාරී වශයෙන්ද කටයුතු කරන්නේය. කිතු බැති ගී දැහැන සිංහල ගීතිකා කෝඩ් ඇප් හා වෙබ් සේවය මොහුගේ නිර්මාණයි.



**බෙනිසි සිල්වා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) දේවධර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. දැනට කිතුනු ධර්මය ඉගැන්වීමේ හා පුහුණුකිරීමේ සේවයේ යෙදී සිටින අතර, අවුරුදු 10ක පමණ තරුණ සේවයේ නායකත්වයද අවුරුදු 24ක පමණ සභාවේ දේවගැති සේවයේද අත්දැකීම් ලද්දෙකි.



**ලසිත් රාජකරුණා,** BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) බයිබලීය අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. යෞවන කිතුමඟ සංවිධානයේ ස්වේච්ඡා නායකයෙකු ලෙස අවුරුදු 16ක්ද, පූර්ණකාලීන සේවකයෙකු ලෙස අවුරුදු 3ක් ද සේවය කර ඇත. මහනුවර බැප්ටිස්ට් සභාවේ ඩීකන් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද ක්‍රියා කර ඇත. ඔහු නුගේගොඩ මෙතෝදිස්ත දේවස්ථානයේ නමස්කාර කරයි.



**බර්නාඩ් කොස්තා,** BTh, MDiv

ඉන්දියාවේ COTR දේවධර්ම ශාස්ත්‍රාලයේද පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේද (IGSL) උපාධිලාභියකි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධි අධ්‍යයන මධ්‍යස්ථානයේ පීඨාධිපති ලෙස සේවය කරමින් ලංකාවේ විවිධ මට්ටම්වල සභා නායකත්වය ගොඩනැගීමෙන් සේවය කළේ ය. වර්තමානයේ පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) නායකත්වය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරයි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**ශානක ප්‍රනාන්දු,** DipArch, DipEng, BTh, MA
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු වසර 13 කට වැඩි කාලයක් වාස්තු විද්‍යාව සහ ඉංජිනේරු විෂයයන් සඳහා කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කර තිබේ. වසර 15 කට වැඩි කාලයක් තරුණයන් අතර සේවය කිරීමේ සහ සභා රෝපණය පිළිබඳ පුරෝගාමී අත්දැකීම් ඇත්තෙකි. ජීවමාන ක්‍රිස්තු සභාවේ සහකාර දේවගැතිවරයෙකු ලෙස ඔහු සේවය කරයි.



**ක්‍රිස්නි එදිරිසිංහ,** BTh
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක (ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය).*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. ඇය ඉරුදින පාසල් ගුරුවරියක් ලෙස වසර 20 ක් සහ පෙර පාසල් ගුරුවරියක් ලෙස වසර 10 ක් සේවය කර ඇති අතර පසුව ශ්‍රී ලංකා ළමා ධර්මදාන සහභාගිත්වයේ (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවය කර ඇත. ඇය කම්පනයට පත් දරුවන් සහ යෞවනයන්ගේ හදවත් සුවපත් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන පුහුණු පහසුකම් සලසන්නියක වශයෙන් සහ මවකගේ අභිප්‍රාය ජාතික කමිටුවේ සම සම්බන්ධීකාරිනිය හා ප්‍රධාන පුහුණුකාරිනියක් ලෙස ද සේවය කරයි. වර්තමානයේ ඇය අන්තර් නිකායික සාකල්‍ය පවුල් සේවා මෙහෙවරයක මෙන්ම ළමා උපදේශකවරියක් ලෙසද සේවයේ නියැලී සිටී.



**ෂර්ලි ෆෙබර්,** BTh
ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි රෙපරමාදු සභාවේ හසල අත්දැකීමක් ඇති දේවගැතිවරයකු මෙන් ම, හිටපු මහා නායකතුමෙක් ද වෙයි. ලංකා බයිබල් විද්‍යාලයේ උපාධිධාරියෙකි. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාලක මණ්ඩලයේ (හිටපු) සාමාජිකයෙකි.



**මිශෙල් පීරිස්,** BTh, MA
***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක (දේවධර්ම උපාධිය).*** ආසියා පැසිෆික් දේවධර්ම ශාස්ත්‍රාලයේ (පිලිපීනය) සහ දකුණු ආසියානු බයිබල් විද්‍යාලය (ඉන්දියාව) උපාධිධාරිණියකි. ජාතික මට්ටමින් තරුණ නායකයින්ට වසර 10 කට වැඩි කාලයක් සේවය කර පුහුණු කර ඇති ඇය දැනට ජීවන මධ්‍යස්ථානයේ, ලංකා දේව සභාවේ (එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සීලෝන්) තරුණ සේවය භාර දේවගැතිවරිය ලෙස ද ලෝසැන් ව්‍යාපාරයේ දකුණු ආසියාතික ප්‍රාදේශික සම අධ්‍යක්ෂක ලෙස ද සේවය කරයි. ලංකා සභාවේ ප්‍රාදේශීය දේශකයෙකු ලෙසද සේවය කරයි.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**මනෝජ් පීරිස්,** DipHTM, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. මීගමුව ප්‍රදේශයේ පැල්පත්වාසී ජනතාව සමඟ සේවය කරන අතර Friends in Christ ගෝලත්ව සේවයෙහි පුරෝගාමී හා මිත්‍රෝපදේශක ලෙස කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ තරුණ සේවය භාර පාලකවරයා වශයෙන් වගකීම් දරයි. සිංගප්පූරුව කවනන්ට් ප්‍රෙස්බිටේරියානු සභාවේ ශ්‍රී ලාංකීය සේවයෙහි ලාංකීය කලාපය භාර සභාපාලකවරයෙක් ලෙස ද කටයුතු කරයි.



**විමලසේන ජයලත්,** BTh, LDD, MA

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. සිව්චතුරාස්‍ර සභාවේ මධ්‍යම පළාතේ වැඩ බලන දේවගැතිවරයා ලෙස ද එම සභාවේ කමිටු සාමාජිකයෙකු හා කිතුනු අධ්‍යාපන අංශයේ අධීක්ෂකවරයෙකු ලෙස ද සේවය කරයි.



**නාමල් වීරසිංහ,** HND (Counselling), BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමග සංවිධානයේ (TFC) වසර 30 ක පූර්ණ කාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්ථමානයේ පුහුණු අංශය හා තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවාවන් භාරව කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබඳව ජාතික ඩිප්ලෝමාව (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව (HND) ලබා ඇත. උපදේශන කටයුතු වල නිරත වන ඔහු ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාවේ ගිහි දේශකයෙකු ලෙස කට යුතු කරයි.



**දිලිප් ගුණවීර,** BTh, MSW


***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උතුරු මැද ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරකවරයාය.*** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සහ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (NISD) උපාධිධාරියෙකි. පුරෝගාමී සේවය සහ දේවගැති සේවය පිළිබඳ වසර දහයකට වැඩි පළපුරුද්දක් ඇති ඔහු මොරටුව කල්වාරි දේවස්ථානයේ සිංහල සභාවේ දේවගැතිවරයා ලෙස සේවය කළේය. වර්තමානයේ ඔහු අනුරාධපුර ලංකා දේව සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.

# කථිකාචාර්යවරුන්ගේ විස්තර



**චමිලා සුභාෂ් රණසිංහ,** HND (Counselling), BTh, BA, MSoc

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි වන අතර ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. තවද, ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උපදේශනය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමාව හදාරා ඇත. වසර ගණනාවක් සභාපාලිකාවක ලෙසත්, ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමනාකාරිනිය ලෙසත් කටයුතු කර ඇති ඇය, කිතුනු මාධ්‍ය ක්ෂේත්‍රයේ මෙන්ම ලේඛන සේවයේ ද නිරත වන්නීය. තවද, ගෝලත්ව සේවයේ මෙන්ම උපදේශන සේවයේ නිරත වන ඇය මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



**අයිවෝ පූබාලන්,** BA (Hons), ThM, PhD

***කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.*** 1996 සිට කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කර ඇති අතර 1998 සිට 2026 දක්වා විදුහල්පති ලෙස සේවය කර ඇත. ලන්ඩන් දේවධර්ම පාසලෙන් (එක්සත් රාජධානිය), ත්‍රිත්ව ඉවැන්ජලිකල් දේවත්ව විද්‍යාලයෙන් (ඇමරිකා එක්සත් ජනපදය), සහ කේප්ටවුන් විශ්ව විද්‍යාලයෙන් (දකුණු අප්‍රිකාව) උපාධි ලබා ගත්තේය. *'මේ යුගයේ දෙවියන් කවුද?': පාවුල් සහ 2 කොරින්ති 4:4 හි දෙවියන් වහන්සේගේ ස්වෛරීභාවය සහ නව උදවට පිවිසුමක්!* *එපීසවරුන්ට පාවුලූතුමා යැවූ හසුන* යන ග්‍රන්ථවල කතුවරයා වේ. *ඔහු ආසියානු ක්‍රිස්තියානි දේවධර්මය, දකුණු ආසියානු බයිබල් විවරණය, NIV දෙවියන්ගේ යුක්තිය බයිබලය* සහ *NIV ඇදහිල්ල අධ්‍යයන බයිබලය* තේරුම් ගැනීම ට දායක වේ. වර්තමානයේ ග්ලෝබල් ඉම්පැක්ට්හි සභාපති ලෙස ද ලෝසැන් ව්‍යාපාරයේ දේවධර්ම ක්‍රියාකාරී කණ්ඩායමේ සම සභාපති ලෙස ද සේවය කරයි.

# CTS පාඨමාලා විස්තර

ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ හතරක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියාතික දේවධර්ම සංගමය (ATA) විසින් පිළිගනු ලැබ තිබේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)**
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම්කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*

**ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය: ළමා සේවා ක්ෂේත්‍රය (CCS-CM)**
සභාව සහ සමාජය සඳහා ඵලදායී ළමා සේවා සේවකයින් සන්නද්ධ කිරීමට නිර්මාණය කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි*
*අන්තර්ජාලය හරහා ඉගැන්වේ*

**දේවධර්ම ඩිප්ලෝමා (DipTh)**
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම්කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි*

**දේවධර්ම උපාධිය (BTh)**
සභා නායකත්වය (දේවගැති සේවය, ඉගැන්වීම සහ එවැනි සේවා) සඳහා කිතුනුවන් පුහුණු කිරීම සඳහා මෙය සැලසුම්කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ
*අවශ්‍ය සම්මාන ප්‍රමාණය 120කි*

***වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:***
අධ්‍යයන කාර්යාලය
011 2890809; student.services@cts.lk; www.cts.lk

***උතුරු කොළඹ අධ්‍යයන මධ්‍යස්ථානය:***
077 1415670; nc@cts.lk

# ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
# ළමා සේවා ක්ෂේත්‍රය

**පාඨමාලාව:**

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
  - සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව.6:00-9:00 දක්වා
- සෑම විෂයක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිමකළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

| | විෂයන් | සම්මාන |
|---|---|---|
| අනිවාර්ය | | |
| බයිබලය සහ දේවධර්ම විෂයන් | 04 | 08 |
| ළමා සේවා විෂයන් | 04 | 08 |
| වෛකල්පික විෂයන් | 10 | 20 |
| සම්මන්ත්‍රණ | 04 | 00 |
| එකතුව | 22 | 36 |

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

**පාඨමාලා දේශන පැවැත්වීම:**

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

**සන්නිවේදන තොරතුරු:**

ක්‍රිස්නි එදිරිසිංහ මිය
සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
දුරකථන අංකය: +94 764823127
විද්‍යුත් තැපෑල්: cm@cts.lk




# CTS ප්‍රකාශන

ඔබත් අලුත් පොතක්
ගැඹුරින් අධ්‍යයනය කර,
දෙවියන් වහන්සේගේ
වචනය සමඟ පවත්වන
සබඳතාව අලුත්ම
මඟකට
යොමු කරගන්න!

**පළමු මහලේ පිහිටි**
**CTS පොත් හලට**
**පිවිසෙන්න**



# CTS පුස්තකාලය

**පොත් 42,000**
එකතුවක්

ඉංග්‍රීසි | සිංහල | දෙමළ

CTS පුස්තකාලය හා අදම සම්බන්ධ වන්න!

වැඩි විස්තර සඳහා
+ 94 112 890809 | library@cts.lk

## CTS පුස්තකාලය සියලු සභාවන්ට විවෘතය

# කිතු සම්ඳාණන් තුළ සබැඳි ජීවිතය

















189 දුටුගැමුණු විදිය, කොහුවල
(+94) 11 2890809 | student.services@cts.lk | www.cts.lk